(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 55]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2008 දෙසැම්බර් මස 03 වැනි බදාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0053/'08

1.

ගරු රවි කරුණානායක මහතා,—මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය යනු 1891 අංක 5 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගම් ආඥා පනත යටතේ සංස්ථාගත කර ඇති ශතවර්ෂයක් පැරණි ව්‍යවස්ථාපිත මූල්‍ය ආයතනයක් බවත්;

(ii) කාරක සභාවේ සභාපති, මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් පත්කරනු ලැබූ නම් කළ සාමාජිකයින් දෙදෙනෙක් හා ඡන්ද විමසීමක් මගින් තෝරා පත්කර ගන්නා ලද කාරක සභා සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත වන කාරක සභාවක් මගින් එය පාලනය කරනු ලබන බවත්;

(iii) එහි කාර්යාලය සඳහා රුපියල් මිලියන 48ක වියදමින් ගොඩනැගිල්ලක් මිල දී ගෙන තිබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) විකුණුම්කරු හා ගැනුම්කරු අතර ඇතිකරගත් අංක 2921 දරන ගිවිසුමට අනුව රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය වෙනුවෙන් "මිල දී ගත් දේපලේ පූර්ණ අයිතිය" මාසයක කාලයක් ඇතුළත ජාතික නිවාස කොමිසමෙන්, විකුණුම්කරු ලබා ගන්නා තෙක් රුපියල් මිලියන 7ක මුදලක් රඳවුම් මුදලක් ලෙස තැබුවේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2006 වර්ෂය සඳහා වූ රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමයේ ගිණුම් පිළිබඳ වාර්තාවේ විගණකාධිපතිවරයා පෙන්වා දී ඇති ආකාරයට දැනට වර්ෂ 3 ½ කට වැඩි කාලයක් ගත වී ඇති නමුත් රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගමය වෙනුවෙන් "දේපලේ පූර්ණ අයිතිය" තවමත් ලබාගෙන නැති බවත්;

(ii) රඳවුම් මුදලින් මිලියන පහක මුදලක් හෙළි නොවූ හේතූන් මත ගෙවා ඇති බවත්:

එතුමා දන්නෙහිද?

(ඈ) මේ සම්බන්ධයෙන් ප්‍රසිද්ධ පරීක්ෂණයක් පැවැත්වීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0122/'08

2.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගේ නිල කාලය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අලුතින් මුද්‍රණය කොට නිකුත් කරන ලද මුදල් නෝට්ටුවල මුළු වටිනාකම කොපමණද;

(ii) ඒවා නිකුත් කිරීමේදී මහ බැංකුව විසින් දක්වන ලද ස්වාමි පුරස්කාරය සමග මුළු මුද්‍රණ වියදම කොපමණද;

(iii) එම නිල කාලය තුළදීම මහ බැංකුව විසින් රජයට ලබා දෙන ලද ස්වාමි පුරස්කාරයෙහි කොටස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමට හෝ කාසි නිපදවීමට යොදා ගත් සමාගම්වල නම් කවරේද;

(ii) එය ප්‍රදානය කරන ලද්දේ ටෙන්ඩර් පටිපාටියක් මගින්ද;

(iii) එසේ නම් ටෙන්ඩර් ඉදිරිපත් කළ සමාගම්වල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0123/'08

3\.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "දැයට කිරුළ" ප්‍රදර්ශනය කොළඹදී පවත්වන ලද දිනය, ස්ථානය සහ පැවැත්වූ කාල සීමාව කවරේද;

(ii) එය පැවැත්වීම සඳහා රජය සහ රාජ්‍ය ආයතන විසින් දරන ලද සමස්ත පිරිවැය කොපමණද;

(iii) මෙවැනි සැණකෙළි පැවැත්වීමේ අරමුණ කුමක්ද;

(iv) මෙම ප්‍රදර්ශනය පැවැත්වීමේ කාර්යයෙහි නියැළුණු පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) මෙයට වඩා ධනාත්මක හා සාධනීය වූ ආකාරයට ප්‍රයෝජනයට ගත හැකිව තිබියදී අහිමි වූ "මිනිස් පැය" ගණන කොපමණද;

(vi) ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0247/'08

4\.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ගස්ථ මගී ප්‍රවාහන (කැබිනට් නොවන) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0273/'08

5\.
ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පශු සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0274/'08

6\.
ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොවිජන සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0412/’08

7.

ගරු පියසිරි විජේනායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මෑතකදී විභාග දෙපාර්තමේන්තුව මගින් පැවැත්වූ තරඟ විභාගයකින් ලංකා බැංකුවට සේවකයින් බඳවා ගත්තේ කවර තනතුරක් සඳහාද;

(ii) එම තනතුරට බඳවාගත් සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) එම තනතුරට බඳවාගත් අපේක්ෂකයින් තරඟ විභාගයේදී ලබා ගත් ලකුණු ප්‍රමාණයන් කවරේද;

(iv) එම එක් එක් අපේක්ෂකයා තම දිස්ත්‍රික්කය අනුව ලබාගත් ලකුණු හා ස්ථානය කවරේද;

(v) දිස්ත්‍රික්ක අනුව බඳවා ගත් අයගේ විස්තර කවරේද;

(vi) තෝරාගත් අය සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සම්මුඛ පරීක්ෂණයට කැඳවූ අපේක්ෂකයින් තරඟ විභාගයෙන් සහ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගත් ලකුණු ඇතුළත් ලේඛනයක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0536/’08

8.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කඩුවෙල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ අම්බලන් වත්ත හෙවත් මල්බෙරි වත්තේ රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) මෙම ඉඩම් කවර අවශ්‍යතා සඳහා වෙනත් පාර්ශ්වයන් වෙත ලබාදීමට කටයුතු කර තිබේද;

(iii) එසේනම්, ඒ කොපමණ ඉඩම් ප්‍රමාණය බැගින්ද;

(iv) ඒ කවර පදනමක් මතද;

(v) මාර්ග සංවර්ධන අධිකාරියට කොටසක් විකිණීමට තීරණය කර තිබේ නම් අදාළ ඉඩම් ප්‍රමාණය සහ විකිණීමට හේතුව කවරේද;

(vi) විකිණීමකින් තොරව වෙනත් කවර හෝ පදනමක් මත ලබාදීමට කටයුතු නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කඩුවෙල ප්‍රදේශයේ ක්‍රීඩා පිටියක අවශ්‍යතාවයක් පවතින බව හා ඒ සඳහා යොදා ගතහැකි වෙනත් රජයේ ඉඩමක් නොමැති බවත්;

(ii) ඒ සඳහා මෙම ඉඩම ලබාදෙන ලෙස ප්‍රදේශවාසීන් විසින් ඉල්ලා තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඒ සඳහා ඉහත ඉඩම ලබාදීමට නොහැකි නම් ඊට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0652/'08

9.

ගරු එම්. ඩී. නාමල් කරුණාරත්න මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩහපොළ, මැදකන්ද හා පරගහඇල කඳු ආශ්‍රිත ප්‍රදේශයේ රජයේ ඉඩම් හා පෞද්ගලික ඉඩම් පිළිබඳ සවිස්තර වාර්තාවක් සහ මඩහපොළ, මැදකන්ද හා පරගහඇල ග්‍රාම නිලධාරි වසම්වල පදිංචි ගොවීන්ගේ ඉඩම්වල හිමිකම පිළිබඳ නෛතික තත්වය කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) මඩහපොළ හා මැදකන්ද ග්‍රාම නිලධාරි වසම්වල ඉඩම් අක්කර 50ක අයිතියක් ඇතැයි පවසමින් යම් අයෙකු විසින් එකී ඉඩම්වල පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කරන බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඒ ආකාර වූ පෞද්ගලික ඉඩමක් එම ග්‍රාම නිලධාරි වසම්වල පිහිටා තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණය සහ එහි ස්වභාවය කවරේද;

(iii) එම ඉඩමේ පළමු අයිතිකරුගේ සිට වත්මන් අයිතිකරු දක්වා වූ පෙළපත් සටහන කවරේද;

(iv) යම් පෞද්ගලික ඉඩම් හිමියෙක් විසින් එම ග්‍රාම නිලධාරී වසම්වල පදිංචිකරුවන් ඉවත් කිරීමට පියවර ගන්නේ නම්, ඔවුන් සඳහා විකල්ප ඉඩම් ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0741/'08

10.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) ගා/උඩුගම දිසා රෝහල, මූලික රෝහලක් ලෙස සංවර්ධනය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අනුමත වී ඇති බවත්;

(ii) මේ වනවිට පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමතිය යටතේ මූලික රෝහලක් සඳහා ප්‍රධාන සැලැස්මක් සකස් කෙරෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැනට රෝහලේ තිබෙන නව ගොඩනැගිලි හැරුනු විට අනෙක් සියලුම ගොඩනැගිලි ඉතාම අබලන් තත්වයේ පවතින පැරණි ගොඩනැගිලි බවත්;

(ii) මූලික රෝහලට අවශ්‍ය නව ගොඩනැගිලි ඉදිකරන තෙක් එම ගොඩනැගිලි පාවිච්චියට ගතහැකි වුවද නව ඉදිකිරීම්වලදී පැරණි ගොඩනැගිලි ක්‍රමානුකූලව ඉවත් කළ යුතු බවත්;

(iii) කරාපිටිය රෝහලේ පවතින අධික තදබදය අඩු කිරීමට හා උඩුගම රෝහලට ආසන්න රෝගීන් රඳවා තබා ගැනීමට මෙම රෝහල කඩිනමින් සංවර්ධනය කළ යුතු බවත්;

(iv) සුනාමි, ගංවතුර වැනි හදිසි තත්වයකදී වුවද කිසිම අනතුරක් නොමැති, ප්‍රදේශයේ එකම රෝහල මෙය බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මූලික රෝහලේ ඉදිකිරීම්, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයට තනිවම සිදුකළ නොහැකි බැවින්, ඔවුන් සමග සාකච්ඡා කර අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන පියවරෙන් පියවර ලබාදීම කොපමණ කාල සීමාවක් තුළ සිදු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0742/'08

11\.
ගරු තිලකරත්න විතානාච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රී ලංගම) උඩුගම ඩිපෝවට අයත් බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් රථ අතුරින් ධාවනයට සුදුසු සංඛ්‍යාව කොපමණද;

(iii) සුලු අලුත්වැඩියාවන්ගෙන් පසුව ධාවනය කළ හැකි බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iv) ධාවනයට යොදාගත නොහැකි බස් රථ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ඩිපෝවේ ඩිපෝ අධිකාරිවරයාගේ සිට සාමාන්‍ය සේවකයා දක්වා කොපමණ කාර්ය මණ්ඩලයක් සිටීද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) රියදුරන්, කොන්දොස්තරවරුන් සහ රාත්‍රී වැඩමුරයේ යෙදෙන කාර්මික නිලධාරීන් සඳහා අවශ්‍ය නේවාසික පහසුකම් ඉතාම අසතුටුදායක මට්ටමක තිබෙන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) සියලුම සේවක මහත්ම මහත්මීන් සඳහා අවශ්‍ය පිරිසිදු පානීය ජලය තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) ඔවුන්ට අවශ්‍ය ආපනශාලා පහසුකම් ක්‍රමවත්ව නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඊ) ඉතා දීර්ඝ කාලයක් තිස්සේ අවම පහසුකම් සහිතව ඉතා ඉහල සේවාවක් සපයන මෙම ඩිපෝවේ සේවක මහත්ම මහත්මීන් සඳහා ඉහත සඳහන් කරන ලද අඩු පහසුකම් සම්පූර්ණ කිරීම කොපමණ කාල සීමාවක් තුළ සිදු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(උ) නොඑසේ නම්, ඒ මන්ද?

0743/'08

12\.
ගරු තිලකරත්න විතානාච්චි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මා විසින් ඉදිරිපත් කරන ලද පාර්ලිමේන්තු උපදේශක කාරක සභා අංක 2647 දරන යෝජනාවට පිළිතුරු ලෙස ගා/නාගොඩ රාජකීය ජාතික පාසලේ අත්‍යාවශ්‍ය ගුරු පුරප්පාඩු හැකි ඉක්මණින් සම්පූර්ණ කරන බව අදාළ නිලධාරීන් ප්‍රකාශ කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගුරු පුරප්පාඩු අතර චිත්‍ර, 6-11 වසර විද්‍යාව, උසස් පෙළ සංයුක්ත ගණිතය, තර්ක ශාස්ත්‍රය, ක්‍රීඩා හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා පුරප්පාඩු තිබෙන බව අදාළ විදුහල්පතිවරයා විසින් සඳහන් කර ඇති බවත්;

(ii) 2008 වර්ෂයේ විද්‍යාපීඨ ඩිප්ලෝමාධාරීන්ගෙන් ඉහත පුරප්පාඩු සම්පූර්ණ කරන බව අධ්‍යාපන අධ්‍යක්ෂ (ගුරු මාරු) ජේ. එච්. එම්. ඩබ්ලිව්. රංජිත් මහතා විසින් අංක ED/01/27/01/09/2008-G දරන 2008.02.25 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) 2008 ජුලි මස වනවිට පොරොන්දු වූ ප්‍රමාණයෙන් කොපමණ ගුරුවරුන් සංඛ්‍යාවක් අදාළ පාසලට ලබා දී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) ගුරු හිඟය නිසා මෙම පාසලේ අධ්‍යාපන කටයුතු වලට බාධා පැමිණ ඇති බැවින් උපදේශක කාරක සභාවේදී එකඟවූ පරිදි ඉහත පුරප්පාඩු සම්පූර්ණ කිරීමට එතුමා කඩිනමින් පියවර ගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0748/'08

13.

ගරු පේමසිරි මානගේ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොඩඋඩ ග්‍රාම නිලධාරි විසින් 2008.06.29 වැනි ඉරිදා දින කෝට්ටේගොඩ තැපැල් කාර්යාල භූමියට අයුතු ලෙස ඇතුල් වී එහි ඉදිකර තිබූ තාප්පය කඩා එහි බිම් කොටසක් නීති විරෝධී ලෙස අත්පත් කර ගෙන සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) ග්‍රාම නිලධාරිවරයෙක් රාජ්‍ය දේපලකට හානි කර එහි භූමිය අත්පත් කර ගැනීම බරපතල වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) මෙම නීතිවිරෝධී ක්‍රියාව සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ ලේකම්ට හා මාතර දිස්ත්‍රික් ලේකම් වෙත පැමිණිලි ලැබී තිබේද;

(ii) ඒ සම්බන්ධයෙන් මේ වන විට ගෙන තිබෙන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) රාජ්‍ය දේපලකට සිදුකර තිබෙන හානිය වැඩ තහනමකට ලක් කිරීමට තරම් වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) (i) එසේ නම්, මේ සම්බන්ධයෙන් අදාළ පියවර නොගැනීමට හේතු කවරේද;

(ii) ඉදිරියේදී මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0749/'08

14.

ගරු පේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කෝට්ටේගොඩ තැපැල් කාර්යාලය වටා ඉදිකර තිබූ තාප්පය කඩා එහි බිම් කොටසක්, ගොඩඋඩ ග්‍රාම නිලධාරි විසින් 2008.06.29 වැනි දින අත්පත්කර ගැනීම සම්බන්ධයෙන් දික්වැල්ල පොලීසියට ලිඛිත පැමිණිලි ලැබී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පැමිණිලි සම්බන්ධයෙන් පොලීසිය විසින් ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේනම් ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රාජ්‍ය දේපල විනාශ කර බලහත්කාරයෙන් කොටසක් අත්පත්කර ගැනීම පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට තරම් බලවත් වරදක් බවත්;

(ii) අධිකරණ තීන්දු නොසලකා රාජ්‍ය දේපල බලහත්කාරයෙන් අත්පත්කර ගැනීම දඬුවම් ලැබිය යුතු වරදක් බවත්;

(iii) අදාළ ග්‍රාම නිලධාරිවරයා සම්බන්ධයෙන් නෛතික පියවර ගතයුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) ඉහත නිලධාරියා සම්බන්ධයෙන් නෛතික පියවර ගන්නේ නම්, ඒ කවරේද;

(ii) ඒ කවර කාලයක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0778/'08

15.

ගරු ජේමසිරි මානගේ මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දික්වැල්ල ප්‍රධාන තැපැල් කාර්යාලය සුනාමියට ලක්වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) දැනට භාවිතා කරන්නේ එම තැපැල් කාර්යාලයද;

(ii) මාර/විජිත ජාතික පාසලට සමීපව පිහිටි නව ගොඩනැගිල්ල තැපැල් කාර්යාලය සඳහා ඉදි කරන ලද්දේද;

(iii) එහි ඉදිකිරීමේ කටයුතු අවසන් වූයේ කවදාද;

(iv) අදාළ ගොඩනැගිල්ලේ ඇස්තමේන්තුගත වියදම කොපමණද;

(v) මූල්‍යමය දායකත්වය සැපයුවේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දික්වැල්ල ප්‍රධාන බස්රථ නැවතුම්පොළේ සිට එම අලුතින් ඉදිකළ ගොඩනැගිල්ලට ඇති දුර කොපමණද;

(ii) සුනාමියට ලක් වූ තැපැල් කාර්යාලයට එම බස්රථ නැවතුම්පොළේ සිට ඇති දුර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේදී

## යෝජනා පිළිබඳ දැනුම් දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 11 සහ 13 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතුය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2009) - (විසිවැනි වෙන්කළ දිනය) — කාරක සභාව (ප්‍රගතිය දෙසැම්බර් 02)

*2.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත යටතේ නියමය— 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනතේ 48 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජූනි මස 06 දිනැති අංක 1552/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.11.04 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

*3.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය

යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධූරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධූරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා නැවත එම ධූරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධූරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*4.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) ව්‍යවස්ථාව අනුව එස්. ස්වර්ණජෝති මහතා 2008.01.04 වැනි දින සිට විගණකාධිපති ධූරයට පත් කරන ලදුව, අනතුරුව විගණකාධිපති තනතුරට හිමි එස්එල්-4 රු. 47,515-12x1,425-64,615 වැටුප් ක්‍රමයේ රු.58,915 වැටුප් පියවරේ පිහිටුවීමට තීරණය කරන ලදී. ස්වර්ණජෝති මහතා ධූරය දරන තාක් කල් වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම අමාත්‍ය මණ්ඩලය විසින් 2008.08.06 වැනි දින තීරණය කරන ලද හෙයින් විගණකාධිපති එස්. ස්වර්ණජෝති මහතාට 2008.01.04 වැනි දින සිට රු. 58,915ක මාසික වැටුපක් ගෙවීමට හා ධූරය දරන තාක් තනතුරට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*5.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*6.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික හා දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| සභාපති (පූර්ණ කාලීන) | | | | |
| පාරිශ්‍රමිකය | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |
| සාමාජිකයින් | | | | |
| පාරිශ්‍රමිකය | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*7.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*8.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 80,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*9.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*10.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 4(8) වගන්තිය අනුව පිහිටුවන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිගේ හා උප සභාපතිගේ වැටුප් 2006.01.01 වැනි දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

උප සභාපති

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 50,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 12.000.00 | මාසික |
| | එකතුව | රු. | 62,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුප් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, 2006 වර්ෂයේ සිට මේ දක්වා කොමිෂන් සභාවේ උපසභාපති තනතුරේ සේවය කර ඇති මහාචාර්ය ලාල් පෙරේරා මහතාට සහ දැනට එම තනතුර දරන ආචාර්ය ජී.ඩී. ගුණවර්ධන මහතාට ද මෙම වැටුප් වැඩිවීම අදාළ විය යුතු යැයිද, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිට හා උප සභාපතිට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*11.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 103— වැඩසටහන 1,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් විසි අට දහස් හැට හත් මිලියන තුන්සිය තිස්අට දහසකට (රු. 28,067,338,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතුය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 103 | — | රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය |
| වැඩ සටහන | 1 | — | මෙහෙයුම් වැඩසටහන |
| ව්‍යාපෘතිය | 2 | — | අමාත්‍යාංශ පරිපාලනය හා ආයතන සේවා |

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | රු. 24,060,779,000 |
| ප්‍රාග්ධන වියදම් | රු. 4,006,559,000 |
| එකතුව | රු. 28,067,338,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2008 දෙසැම්බර් මස 03 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 10 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 9 දක්වා එකතුව රුපියල් 28,089,980,332.

*12.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 37 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 37 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 “ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ගබඩා අත්තිකාරම් ගිණුම” දුම්රිය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,000,000,000<br>රු. 680,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 3,800,000,000<br>රු. 3,900,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 400,000,000<br>රු. 550,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2008.08.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*13.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 03 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 03 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2007 අංක 61 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 23202 "බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අත්තිකාරම් ගිණුම" බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | | |
|---|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.<br>රු. | 6,70,00,000<br>7,90,00,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.<br>රු. | 6,80,00,000<br>8,00,00,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2008.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2008.11.04 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*14.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 දිනැති අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද "2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ (තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතුය.

*15.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතුය.

*16.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 දිනැති අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*17.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතුය.

*18.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*20.

ජාතික පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*23.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*24.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*25.

ඉන්ද්‍රිය සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*26.

අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*27.

ඉඩම් සංවර්ධන ආඥාපනත (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*28.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*29.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*30.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*31.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*32.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

33.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

34.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

35.

ශ්‍රී පාද කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

36.

තාලියවක ශ්‍රී ආනන්ද බෝධි සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

37.

එක්සත් ජනඉසුරු පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

38.

පූජ්‍ය මූණමලේ ධම්මරතන ගුණානුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

39.

ලෝක බෞද්ධ මහා සම්මේලනයේ ශ්‍රී ලංකා ප්‍රාදේශීය මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

40.

විශ්‍රාමික ජ්‍යෝෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

"විසර්ජන පනත් කෙටුම්පත (2009)" නමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

**[1]**

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---